PAFFREL
නිදහස් හා සාධාරණ මැතිවරණයන් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය.
சுதந்திரமானதும் நியாயமானதுமான தேர்தல்களுக்கான மக்கள் செயற்பாடு.
PEOPLE'S ACTION FOR FREE & FAIR ELECTIONS

ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා, 2022.03.31
සභාපති,
පාර්ලිමේන්තු තේරීම් කාරක සභාව,

ගරු සභාපතිතුමනි,

**<u>ඉදිරි මැතිවරණ ක්‍රම සංශෝධන වලදී නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික හරය රැක ගනිමු, කාන්තා නියෝජන, තරුණ නියෝජනය තහවුරු කරමු.</u>**

ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදී රාමුව ශක්තිමත් කිරීමට පත්කල බොහෝ පාර්ලිමේන්තු කමිටු වල ඔබතුමා සභාපතීත්වය දැරූ අතර එමගින් රටට දායාද කල බොහෝ සාධනීය සංශෝධන අප ගෞරවයෙන් යුතුව සිහිපත් කරමු. එමෙන්ම වර්තමානයේද මැතිවරණ නීති සංශෝධන සඳහා වන පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවේ නායකත්වය දැරීම අප තුළ විශ්වාසය දනවන්නකි.

එහෙත් මේ වන විට පළාත් පාලන මැතිවරණ ක්‍රමයේ සංශෝධන පිළිබඳව ඔබ තේරීම් කාරක සභාවේ සාකච්ඡාවට භාජනය වූ බවට වාර්තා වන සමහර කරුණු හා වාර්තා ප්‍රජාතන්ත්‍රවාදී නියෝජන ක්‍රමයක මූලික හරය පවා නොසලකා හැරි තත්ත්වයක් බව පෙනී යයි.

කොට්ඨාශ පදනම 70% දක්වා වැඩි කිරීම, අවම ඡන්ද ප්‍රතිශත ලෙස 2.5% අගයක් ලෙස සලකා බැලීම, එල්ලන ආසන ප්‍රමාණය ඉවත් කිරීම, බෝනස් ආසන හඳුන්වා දීම, මතුපිටින් සලකා බැලීමේදී යහපත් යෝජනා ලෙස පෙනී ගියද මෙම යෝජනා ක්‍රියාත්මක වුවහොත් සමානුපාතික ක්‍රමයේ සම අනුපාතය එනම්, නියෝජන ක්‍රමයේ තිබිය යුතු මූලික පදනම වන මහජන මතයට සමපාතව නියෝජිතයින් පත්වීම බරපතල ලෙස අභියෝගයට ලක් වේ. ඊට අමතරව කුඩා පක්ෂ දේශපාලන ප්‍රවාහයෙන් ඉවත් වීමද සිදුවිය හැක. එය අනිටු දේශපාලන ප්‍රතිවිපාක ගෙන දෙන්නකි. මෙම පළාත් පාලන ක්‍රමය සංශෝධනයේ මූලික අරමුණද අභියෝගයට ලක් කරයි. මෙම යෝජනා වලදී පළාත් පාලන ආයතන වල බලය හා ස්ථාවරභාවය පිළිබඳව සලකා බලා තිබුනද සාධාරණ මහජන නියෝජනය යන්න නොසලකා හැර ඇත.

එමෙන්ම දැනට ක්‍රියාත්මක කාන්තා නියෝජන කෝටාව අවම කිරීම කෙරෙහි අවධානය යොමු කර ඇති බවද වාර්තා වේ. එය රටෙහි 52% වන කාන්තාවන්ගේ දේශපාලන අයිතිය හකුලවාලීමකි. එමෙන්ම ඔවුන්ටද ලබාදුන් දේශපාලන අවකාශය ආපසු හැරවීමක් වන අතර ශ්‍රී ලංකාවේ දේශපාලන සංස්කෘතියේ වෙනසක් ඇති කිරීමට ඇති අවස්ථාවක් ද අහුරාගැනීමකි. එය ජාත්‍යන්තරවද ලංකාවේ ප්‍රතිරූපයට හානි කරවන්නක් විය හැකිය.

#No.16, Byrde Place, Off Pamankada Rd, Colombo 06.
Tel : (+94) 11 2558570 / 11 2558571 Fax : (+94) 11 2558572
Email : paffrel@sltnet.lk Web : www.paffrel.com

එබැවින් අප ඔබතුමන්ගෙන් හා පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවේ සියලු සාජිකයන්ගෙන් ඉල්ලා සිටින්නේ; පළාත් පාලනය පිළිබඳව ඉදිරි සංශෝධන වලදී මහජන මතයට සමපාතිකව නියෝජන ක්‍රමය ලැබෙන සේ සංශෝධන සිදුකරන ලෙසත්, කාන්තා නියෝජනයේ ලබාදී තිබූ 25% කෝටාව එලෙසම ආරක්ෂා කරන ලෙසත්, තරුණ තරුණයින් සඳහා සාධාරණ නියෝජනයක් ලැබෙන ආකාරයට සංශෝධනය සිදුකරන ලෙසත්ය.

මෙයට,
විශ්වාසී,

රෝහණ හෙට්ටිආරච්චි
විධායක අධ්‍යක්ෂ

පිටපත -
1. පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවේ සාමාජිකයින්
2. මැතිවරණ කොමිෂන් සභාව
3. මාධ්‍ය ආයතන (උනන්දුවක් දක්වන සෙසු ආයතන)